# Living the Lotus 4

## Buddhism in Everyday Life

2026
VOL. 247











## The Brazil Dharma Center Welcomes Rev. Takashi Maeda, Director of Rissho Kosei-kai International, on March 22


**Living the Lotus**
**Vol. 247 (April 2026)**

Senior Editor: Takashi Maeda
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga, Sahan Chamara

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමි ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.
වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（ioaO¾u mqKavÍl iq;%h ;=, Ôj;afjuq - tosfkÞ osúhg nqÿ oyu noaO lr .ksuq'）hk f;audj ;=," tosfkÞ ðù;hg ioaO¾u mqKavÍl iq;%fha lshdoSï noaO lr f.k ufvys msfmkakdjq ,iaik fk¨ï u,la fia ;u ðú;h iuDêu;a lrf.k" tf,iu jeä jákdlñka hq;= ;;ajhg m;a úhhq;=h hk m%d¾:kh .eí ù we;' fuu iÕrdj uÕska f,dalh mqrd jHdma; ù isákakdjq idudðl idudðldjka tosfkÞ osúhg nqÿoyu noaO lrf.k lghq;= lrkakdjq whqre wka;¾cd, ud¾.fhka fnÞyeßu isÿ lrkq ,efí'

会長法話

# පොඩි වයලට් මලක් මෙන් පොඩි මිනිසෙකු වෙමු



**නිචිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

## සෝසෙකිගේ කාව්‍ය සහ උදර වාක්‍යය

1897 වසරේ නවකතා රචකයෙකු වන නට්සුමෙ සෝසෙකි මහතා ඔහුගේ ආදරණීය මිතුරා වන ශිකි මසඔකාට 'මා වයලට් මලක් තරමේ පොඩි පුද්ගලයෙකු ලෙස උපන්නෙමි' ලෙස කාව්‍යයක් යවා ඇත. මෙම කාව්‍යය චීනය සමඟ පැවති යුද්ධයෙන් ජපානය ජයග්‍රහණය කල පසු, ජපානය නූතන ජාතියක් බවට පත් වීමේ උද්දමයත් සමඟ වන වාතාවරණය යටතේ රචනා කර ඇත. නමුත් සෝසෙකිගේ හැඟීම් බොහෝ දුරට දුක්බර බවක් පෙනේ.

මිනිසුන් තම පෞද්ගලිකත්වය වැදගත්ව සලකමින් ගෞරවයෙන් ජීවත් වීම ඉතා වැදගත් දෙයකි. එම අවබෝධය වරදවා වටහා ගත් විට, තමන් පිළිබඳව ආඩම්බර වන සහ අන් අයව බිය ගැන්වීමේ අහංකාරකමකට මඟ පාදයි. එහිදී ඇතැම් විට එකිනෙකා අතර ගැටුම් ඇති කිරීමට ජනතාව පෙළඹවීමේ භයානක මනෝභාවයන් පවා පැතිර යා හැකිය. එවැනි යථාර්තයකට මුහුණ පාන විට, 'මම මාර්ගය අද්දර නිහඬව පිපෙන වයලට් මලක් මෙන්, කැපී පෙනෙන්නේ නැති වුවද, ශක්තිමත්ව ජීවත් වෙමින් මාව දකින අයගේ හදවත් සනසමින් සුවපත් කරවන අයෙක් වීමට කැමතියි' යන ප්‍රාර්ථනාව මෙම කාව්‍යයේ අඩංගු වී ඇති බව හැඟේ.

අප්‍රේල් 8 දින ජපානයේ සිදුහත් කුමාර උපත සමරනු ලබනවා. සිදුහත් කුමාරා උපත ලැබීමෙන් පසුව උදර වාක්‍යයක් ප්‍රකාශ කලා. 'මම ලොවට අග වෙමි, මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි' පදයෙහි අර්ථය මෙනෙහි කරන විට, එය සෝසෙකිගේ සිතුවිලි සමඟ සම්බන්ධ වන නිහතමානී බව සහ ස්වයං විමර්ශනය මෙන්ම තමන්ට සහ අන් අයට ගරු කිරීමේ වැදගත්කම අපට ඉගැන්වෙන බව පිළිගත හැකිය.

සියලුම මිනිසුන්, මේ ලොකයේ සිටින වටිනා ජීවීන් කොට්ඨාශයකි. එය අවබෝධ වූ විට, අහංකාර අභිලාෂයන් මත අන් අය සමඟ තරඟ කිරීම කොතරම් මෝඩකමක් දැයි වැටහෙනු ඇත. ඒ සමඟම, තමාට සහ අන් අයට ගරු කිරීම තුලින් සැම දෙනා සමඟම සමගියෙන් ජීවත්වීමට හැකිවේ. එය අප මිනිසෙකු ලෙස උපත ලැබීමේ අරුථ වනවා සේම, 'කෘතවේදීත්වය සහ කරුණාව අන් සියල්ලටම වඩා වැදගත්' යන ඉගැන්වීමෙහි අර්ථයත් හොඳින් වැටහෙනු ඇත.

අහංකාර සහ ආත්ම තෘප්තිමත් ජීවන රටාවක් ගත කිරීමට වඩා, සෑම විටම කැපී පෙනීමට උත්සහ නොකරන පොඩි පුද්ගලයෙක් වී, මිනිසුන්ගේ හදවත්වල සාමය සහ සමගිය ගොඩගැනීමට හැකිනම් එය සදකාලික සතුටට කරුණකි.

## අපගේ උපතේ අර්ථය

සෝසෙකි 'වයලට්' මලක් වීමට කැමැත්තක් දැක්වුවද, ඔබ කුමන ආකාරයේ මලක් වීමටද කැමති?

ජපානයේ මෙම වසන්ත සෘතුවේ නම්, මැන්ගෝලියා මල්, සකුරා මල් සහ ඩැන්ඩේලියන් මල් ඉතා ප්‍රියජනක වන අතර, සන්සුන් සුවඳක් ගෙන එන ඩැෆ්නි මල්ද මතකයට නැගේ. 'මල්වල අලංකාරත්වයට ශ්‍රේණිගත කිරීමක් නොමැත' ලෙස දැඩිව ප්‍රකාශ කල අයෙක් සිටී. සෑම මලක්ම උපරිමයෙන් අලංකාරව පිපෙන අතර, එහි උස් පහත් බවක් හෝ ලස්සන අවලස්සන ලෙසද වෙනසක් නැත.

දර්ශනිකයෙකු වන කිතරෝ නිෂිද මහතා ,
'මලක් එහි සැබෑ ස්වභාවය හෙළි කරන විට මල වඩාත් ලස්සන වනවා සේම, මිනිසෙක් තම මනුෂ්‍ය ස්වභාවය හෙළි කරන විට ඔහු සුන්දරත්වයේ උච්චතම අවස්ථාවට ළඟා වේ' ලෙස පවසා ඇත.

බුදු දහමේ ඉගැන්වීම් අධ්‍යයනය කර ඒ අනුව ජීවත්වන අපට, මිනිසුන්ගේ සැබෑ ස්වභාවය වන්නේ බුද්ධ ස්වභාවය මිස අන් කිසිවක් නොවේ. එය තමන් විසින්ම අවබෝධ කරගෙන අපගේ බුද්ධ ස්වභාවය විදහා දක්වන විට අපගේ ජීවිත මල් මෙන් වන අතර අපි අපගේ යුතුකම් ඉටු කර ඇත්තෙමු. මනුෂ්‍යයෙකු උපත ලැබීමේ අරුථ ඒ තුල ගැබ්වී තිබේ.

කෙසේ වුවද, එක් එක් පුද්ගලයා තම ජීවිතයේ අරුත වටහා ගැනීමට ගතවන කාලය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ, එමනිසා විශේෂයෙන්ම තරුණ තරුණියන් කනස්සලට හෝ අශුභවාදී වීමට අවශ්‍ය නොවේ.

මගේ ප්‍රියතම කවියක 'අපි මේ ලෝකයේ ජීවත් වන්නේ කිසිම අරමුණකින් තොරව, යහපත් හදවතක් ඇතිව පමණයි' (සෙක්කෙයි සසෙන්) ලෙස ඇත. එහි අර්ථය මනස සැහැල්ලු කරගෙන, දුක කෝපය සහ ආශාවන් අඩු කරගෙන, කැපී පෙනෙන්නේ නැති වුවද, සෑමවිටම අවංක සිතුවිල්ලෙන් සිටිය යුතු බවයි.

කාංසාව සහ අතෘප්තිමත් බව වර්ධනය වන යුගයකදීත්, අපි මෙම ආකල්පයන් පවත්වාගෙන 'අන් අයට මුල් තැන දීම' අමතක නොකර , සියලුම දෙනා තමන්ගේම අද්විතීය චරිතයකින් යුත් මලක් ලෙස පිපෙනු දැකීමට මම කැමතියි.

(2025 අප්‍රේල් මස 'කෝසෙයි' සඟරාව ඇසුරෙණි)



# බුදුන් වහන්සේගේ ප්‍රඥාව සහ මහා කරුණාව හැකිතරම් පිරිසකට කියාදීමට කැමතියි

## නිකොලා ටිනි මහතා, ඉතාලියේ රෝම ශාඛාව

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූයේ කවදද කුමන හේතුවක් නිසාද?**

1972 අවුරුද්දේ රෝමයේදී මම උපත ලැබූ අතර වයස අවුරුදු 18 වන තෙක්ම ආගමක් කෙරෙහි උනන්දුව නොතිබුණු නමුත් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන ගමන්ම 'නැගෙනහිර ආධ්‍යාත්මිකත්වය' යනුවෙන් පන්තියකට සම්බන්ධ වූවා. එහිදී මම ඉන්දියාව චීනය සහ ජපානය තුල වූ බුදු දහම ගැන ඉගෙන ගත් අතර බුදුන් වහන්සේගේ පැවැත්ම ගැන ඉගෙන ගත්තා. මුලින්ම බුදුන් වහන්සේත් ක්‍රිස්තියානි ආගමේ දෙවියන් වහන්සේත් එකහා සමාන යැයි සිතුවත් පසුව එය එසේ නොමැති බව වැටහුණා. එතැන් සිට මා තුල බුදු දහම ගැන උනන්දුව වැඩි වූ අතර විවිධ වූ බෞද්ධ ග්‍රන්ථ කියවන විට 13 වන සියවසේ ජපානයේ විසූ නිචිරෙන් ෂෝනින් නම් ශ්‍රේෂ්ඨ බෞද්ධ භික්ෂුව ගැන දැනගන්නට ලැබුණු අතර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් කැපවීමෙන් ප්‍රචාරය කල බව දැන ගැනීමත් සමග  සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන ආසාවක් ඇතිවූවා.

පසුව රෝමයේ ජපන් සංස්කෘතික මධ්‍යස්ථානයේ පුස්තකාලයෙන් රිෂ්ෂෝ කෝසෙයි කායි නම් (1966 අවුරුද්දේ ප්‍රකාශයට පත් කරන ලද) ඉංග්‍රීසි භාෂාවේ පොතක් හමු වුනා. එයින් රිෂ්ෂෝ කෝසෙයි කායිහි ඉතිහාසය සහ පදනම ලෙස සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය භාවිතා කරනවා යන්නත්, නව දයිසේදෝවේ ඡායාරූප මෙන්ම එහි සිදුකරන වත්පිළිවෙත් සූත්‍ර සාජ්ජායනා කිරීම් සහ  වතිකානුවේදී නිර්මාතෘ තුමන් සහ සයවන පාප් වහන්සේ සමග ගත් චායාරූපයක් ද තිබුණා. පොතෙහි අන්තර්ගතය ගැන මම පැහැදුණ නිසා රිෂ්ෂෝ කෝසෙයි කායි මූලස්ථානය වෙත මම ලිපියක් යැවූ අතර, සති දෙකකට පමණ පසු පිළිතුරු ලිපියක් ලැබුණු අතර මහත් සතුටකින් මම එය කියෙවුවා. එහි රෝමයේ විශ්ව විද්‍යාලයක එගෙනුම ලබන රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයෙකුගේ නමක් සහ දුරකතන අංකයක් සදහන් වූවා. (දැනට තෝකියෝ සුගිනමි ධර්ම ශාඛාවේ කියෝකයිචෝ කොයිචි කවමොතෝ මහතා.) මතකයේ හැටියට මෙය 1992 පමණ කාලයේ සිදුවූවා.



නිකොල ටිනි මහතා

**එක් පොතක් බුදුන් වහන්සේව මුණගැස්සුවා නේද**

කවමොතෝ මහතා මගේ නිවසට කිහිප වතාවක්ම පැමිණි අතර, පවුලේ අයට සහ හිත මිතුරන්ට බුදු දහමත් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයත් සහ කෝසෙයි කායි ඉගැන්වීමුත් උත්යෝගීමත්ව කියා දුන්නා. ඔහුට ස්තූතිවන්ත වන්නට රෝමය තුල කුඩා නමුත් ධර්ම මිතුරු කැලක් නිර්මාණය වූවා. කවමොතෝ මහතා අපට විශ්වාසය තැබිය හැකි වැදගත් නායකයෙකු වූවා නමුත්, ඔහුගේ විදේශ අධ්‍යාපනය අවසන් කර නව වැඩ කටයුත්තක් වෙනුවෙන් ආපසු ජපානයට යාමට සිදු වුණා. වයස විසිගනනක් වූ තරුණ වියේ පසු වූ මම නායකයෙකු නොමැතිව ඉදිරියට යායුතු ආකාරය ගැන කනස්සල්ලට පත් වූ අතර, පසුව මම පැවිදි වීමට තීරණය කලා. 1998 අවුරුද්දේ සිට මම ගිහි භික්ෂුවක් ලෙස පුහුණුවීම් කල අතර, ඊට පසු අවුරුද්දේ මම  පැවිදි වූවා. කෙසේ වෙතත් මම පසුව කල්පනා කලේ 'ගිහියෙකු ලෙස ධර්ම පුහුණුව දිගටම කරගෙන යාම' වැදගත් බවයි. පසුව රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය තුල සද්ධර්ම පුණ්ඩරීක සූතය හොඳින් අධ්‍යනය කර පුහුණුව ප_ගුණ කිරීමට මම දැඩි තීරණයක් ගත් අතර මම ගිහි ජීවිතයට නැවත පැමිණ 2003 අවුරුද්දේ රිෂ්ෂෝ කෝසෙයි කායි

සංවිධානයට සම්බන්ධ වූවා. ඉන් වසර 10 ට පසු 2013 අවුරුද්දේ රෝම ධර්ම ශාඛාව ආරම්භ කල අතර, අපගේ නව පුහුණුවේ ආරම්භය සනිටුහන් කරමින් කට්සුතොෂි මිසුමෝ මහතා කියෝකයිචෝ බවට පත්වූවා. (වර්තමාන හමකිතා ධර්ම ශාඛාවේ කියෝකයිචෝ).

**නිකොල මහතා පසුගිය ඔක්තෝබර් මාසයේ රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානයේ පැවති පරිවර්තකයින්ගේ රැස්වීමකට සහභාගී වීමට ජපානයට පැමිණියා නේද. දැනට පරිවර්ථනය කරන ප්‍රකාශන මොනවාද?**

රෝම ධර්ම ශාඛාව විවෘත කිරීමෙන් පසුව මගේ පළමු කාර්යය වූයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉංග්‍රීසි පරිවර්තනය ඉතාලි භාෂාවට පරිවර්තනය කිරීමයි. ඒත් සමගම, නිර්මාතෘ තුමා විසින් රචිත 'තෙවැදෑරුම් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ වෙළුම් 10 කින් සමන්විත විවරණය', 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ නව විවරණය' සහ නිචිකෝ නිවානෝ තුමාගේ 'හදවත සහ මනස සංවර්ධනය' යන පොත් පරිවර්තනය කලා. 'Living the Lotus' නම් මාසික සගරාවේ එන නිර්මාතෘ තුමාගේත්, නිචිකෝ නිවානෝ තුමාගේත් දහම් පණිවිඩයනුත් පරිවර්ථනය කිරීමට කටයුතු කරනවා. කෙසේ වෙතත් පරිවර්තනයන් සඳහා වැඩි ඉල්ලුමක් තිබෙන අතර ඒ වෙනුවෙන් දැඩි කැපකිරීමක්ද අවශ්‍ය වන අතරම මම දැඩි ආතතියකට මෙන්ම තනිකමකටද මුහුණ දුන්නා. එවැනි අවස්ථාවලදී, ජාත්‍යන්තර මූලස්ථාන කාර්යය මණ්ඩලයෙන් විද්‍යුත් තැපෑල මගින් සහ ඔන්ලයින් හරහා ධර්ම සාකච්චාවන් පවත්වා මාව දිරිගන්වමින් ලබා දුන් සහයෝගය නිසාවෙන්න් ආතතියන්ගෙන් මිදීමට තනිකම ජයගන්න හැකිවුනා



2025 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදී රෝම ශාඛාවේ සාමාජිකයින් සමග ජපානයට පැමිණි නිකොල මහතා (දකුණු පස කෙලවරේ සුගිනමි ධර්ම ශාඛාවේ කියෝකයිචෝ මිට්සුඉචි කවමොතෝ මහතා)




2025 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 12 වන දින නිර්මාතෘ තුමාගේ උපන් ගමෙහි පැවති උත්සවයට හමකිතා ධර්ම ශාඛාවේ සාමජිකයින් සමහ සහභාගී වීම (පසුපස පේළියේ මැද)

යැයි මා විශ්වාස කරනවා. ජත්‍යන්තර කණ්ඩායමේ දිගුකාලීන සහයෝගයට ස්තූතිවන්ත වන්නට, මේ වසරෙ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉතාලි පරිවර්ත්නය ප්‍ර කාශයට පතකිරීමට හැකිව තිබෙන අතර එයට පෙරවදනක් එක් කිරීමට නිචිකෝ නිවානෝ තුමා කටයුතු කිරීම ගැන මම විශේෂයෙන් කෘතඥ වනවා.

**සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ගැඹුරු අර්ථයන් සහ විශේෂ යෙදුම් අන්තර්ගත වන නිසාවෙන් පරිවර්තනයේදී සැලකිය යුතු ලෙස අභියෝග වලට මුහුණ දෙන්නට ඇතියි කියා සිතනවා. ඒ වෙනුවෙන් විශේෂයෙන් අවධානය යොමු කලේ කුමකටද?**

ඕනෑම පරිවර්තනයක් මෙන්, විශේෂයෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය පරිවර්තනය කිරීමේදී සෑම වචනයකම සහ වාක්‍ය ඛණ්ඩයකම අර්ථය ඉතා නිවැරදිව හා සම්පූර්ණයෙන්ම ප්‍ර කාශ කිරීම සහතික කර ගැනීම වෙනුවෙන් වඩාත් සුදුසු ඉතාලි ප්‍ර කාශන ඉතා ප්‍ර වේසමෙන් තෝරා ගත්තා. පහසුවෙන්ම වැරදි වැටහීමත් ලබාදිය හැකි වචන සහ වාක්‍ය ඛණ්ඩයන් සඳහ පරිවර්තන ගැන වඩාත් සැලකිලිමත් වූවා. සියල්ලටත් වඩා සියලු දෙනා විද්වතුන් නොවන බැවින්, රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයින් පමණක් නොව නූතන ලෝකයෙ විශාල පිරිසක් මෙම පොත් කියවන බැවින් ඔවුන්ටද පහසුවෙන් තේරුම් ගැනීමට හැකි ලෙස භාෂාව හසුරවීමට වගබලා ගත් අතර, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය එදිනෙද ජීවිතයේ 'ජීවමාන ඉගැන්වීමක් ලෙස' ප්‍ර ගුණ කිරීමට ඉඩ සලසන පරිවර්තනයක් නිර්මාණයට හැකි සෑම විටම උත්සහ කලා. බුදුන් වහන්සේගේ ප්‍ර ාර්ථනයන් සහ නිර්මාතෘ තුමාගේ හැඟීම සමග මෙය එකට

පෙළගැසෙන බව සහතික කිරීම වෙනුවෙන් පරිවර්තන ක්‍රියාවලිය සඳහා සම්බන්ධ සියලුම දෙනා බොහෝ සාකච්ඡාවන් පැවැත්වූවා. පරිවර්තනයන් හරහා සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සමග අපූරු ගමනක් ආරම්භ කර තිබෙනවා යැයි මට හැගෙනවා.

**ජපානය තුල ගත කල කාලයේ විවිධ වූ අත්දැකීම් තිබෙනවා නේද.**

පරිවර්තකයින්ගේ රැස්වීම මගේ ජපන් සංචාරයේ ප්‍රධාන අරමුණ වූ අතර, සති තුනක පමණ කාලයක් තුල මම විවිධ වූ අමතක නොවන වටිනා අත්දැකීම් රාශියක් ලබාගත්තා. යමනාෂි ප්‍රාන්තයේ නිචිරෙන් නිකායේ මිනොබු සාන් හි කුඔන්ජි පන්සලට, ෂිසුඕකා ප්‍රාන්තයේ හමකිතා ධර්ම ශාඛාවේ රාත්‍රී පුහුණුව ලබාගත් අතර, නීගතා ප්‍රාන්තයේ තෝකමචි නගරයේ නිර්මාතෘ තුමා උපන් ස්ථානයේ සූත්‍ර සජ්ජායනයකට සහභාගී වී සුගිනම් ධර්ම ශාඛාවේදී ආදි මුතුන් මිත්තන්ට පිංපෙත් පැමිණවීමේ සූත්‍ර සජ්ජායනයක් පැවැත්වීම, තෙදොරි හෝසා පැවැත්වීම වැනි ධර්ම පුහුණුවක් ලබා ගත්තා. ඊට අමතරව සුගිනම් ධර්ම ශාඛාවේ සාමාජිකයින් සමග දයිසේදෝවේ ඔඑෂිකි පෙරහැරට සහභාගී වීමට හැකි වුනා. ඒ වෙනුවෙන් මම හදවතින්ම කෘතඥ වනවා. ඉදිරියේදී, මම ජපානයේදී මේ ලද අත්දැකීම් ඉතාලියේ මගේ ධර්ම මිතුරන් සමග බෙදගන්න සිතනවා.

**සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් වලින් හදවතට දැණුනු ධර්ම කරුණු මොනවාද?**

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සෑම පරිච්ඡේදයක්ම විශිෂ්ඨ වන අතර, ඒතුල ගැඹරු අර්ථයන් ගැබ්ව පවතිනවා. නමුත් මෑත කාලයේදී 21 වන පරිච්ඡේදය මාසිත් ගත්තා. මෙම පරිච්ඡේදය බුදුන් වහන්සේ පොළොවෙන් මතුවී ආ බෝධිසත්වයන්ට, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අනාගත පරම්පරාවට කියා දෙන්න ඔවුන් තුල ධර්මය ව්‍යාප්ත කරන්න යැයි වගකීම භාරදෙන වැදගත් පරිච්ඡේදයක් වනවා. එය වර්තමාන ලෝකයේ ජීවත් වන අපට වැදගත් පණිවිඩයක් ගෙන එනවා යැයි මා සිතනවා. ජපානයේ පමණක් නොව ඉතාලිය, ප්‍රංශය, ස්පාඤ්ඤය සහ ලෝකයේ කොතැනක සිටියත් 'ඔබ දැන් කොතැනක සිටියත් ධර්මය ව්‍යාප්ත කිරීමට ඔබේ උපරිමය කරන්න' යනුවෙන් බුදුන් වහන්සේ අපට දිරි ගනවන පණිවිඩයක් ලබා දෙනවා යැයි මම සිතනවා. එනිසා බුදුන් වහන්සේගේ දිව්‍යමය බලය 21 වන පරිච්ඡේදය ගැන උනන්දුවක් තිබෙනවා.

**අවසාන වශයෙන් ඔබගේ වර්තමාන බලාපොරොත්තුව සහ අනාගත අරමුණ කුමක්ද?**

යුක්‍රේනය සය පලස්තීනය අතර යුධ ගැටුම් තවමත් පවතින අතර අවාසනාවකට මෙන් ලෝකය බෙදී ගැටුම්කාරී තත්වයක් උදවී පවතිනවා. අප සෑම නිර්මාතෘ වකිසො සමා හරහා 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ පදනම ලෙස ලෝකයේ සියළු ජාතීන්ට ව්‍යාප්ත කරන්න' යනුවෙන් දේව ආශිර්වාදයක් තිබුණා මෙන් අද මට තදින්ම හැගෙනුයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් ලොවට ප්‍රචාරණය කිරීමේ වගකීම කෝසෙයි කායි සංවිධානය සතු වන බවයි. එය හදවතේ තබාගෙන රෝමය කේන්ද්‍ර කරගනිමින්, ධර්ම මිතුරන්ගේ එකමුතුකම වර්ධනය අරමුණු කරගෙන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් ප්‍රචාරණය කිරීම වර්තමාන බලාපොරොත්තුවයි. එහි අදහස නම්, සෑම කෙනෙකුම බුදුන් වහන්සේගේ ප්‍රඥාව සහ අනුකම්පාව ලබාගෙන හැකිතරම් පිරිසකට එය ලබාදීමයි. මගේ අනාගත සිහිනය රෝම ධර්ම ශාඛාවේ කියෝකයිචෝ ලෙස කටයුතු කිරීමයි. ඒ සඳහා එදිනෙද කටයුතු තුල වෙනදටත් වඩා කැපවීමෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අධ්‍යනය කර ප්‍රගුණ කිරීමටත්, ධර්ම මිතුරන් සමග එක්ව ධර්මය ව්‍යාප්ත කිරීමටත් හැකිතරම් ඉතාලි ජාතිකයින්ට සතුට ගෙන ඒමටත් කටයුතු කරනවා.



රෝම ශාඛාවේ ධර්ම මිතුරන් සමග (දකුණු පස සිට 4 වැනියා)

# තථාගතයන් වහන්සේගේ සිවුර දරා ගැනීම

## මනුෂ්‍ය සබඳතාවලදී 'මෘදු බව' ඉතා වැදගත් වේ

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය




ඉබරකි පලාතේ ධර්ම ව්‍යාප්ත කටයුතු සඳහා සහභාගී වූ නිර්මාතෘ තුමා හා සම නිර්මාතෘ තුමිය 1952 වර්ෂයේදී

වර්තමාන සමාජයේ බොහෝ දෙනා සොයන වැදගත්ම දේ කුමක්දැයි සිතා බැලුවහොත්, එය මානසික සහනය සහ මානසික දියුණුව බව පැහැදිලිය. විශේෂයෙන්ම මනුෂ්‍ය සබඳතා පිළිබඳව බොහෝදෙනා උනන්දු වන අතර, තමන් අවට සිටින අය සමඟ සුහදශීලී හා සාමකාමී සබඳතාවක් පැවැත්වීම සැමගේ ප්‍රාර්ථනාවයි.

අපි බොහෝ විට 'මගේම ශක්තියෙනුයි මම ජීවිතය ගත කරන්නේ' යැයි සිතනවා. නමුත් ජීවිතය යනු එතරම් සරල දෙයක් නොවේ. චීන රූප අක්ෂර වලින් 'මිනිසා' (人) ලෙස ලියන්නේ මෙසේයි. එම අකුර සෑදී ඇත්තේ එක් රේඛාවක් තවත් රේඛාවකට ආධාර වීමෙනි. එම අකුරේ හැඩයෙන් උගන්වන පරිදි, මිනිසුන් යනු එකිනෙකාට සමීප වෙමින්, එකිනෙකාට උපකාර කරගනිමින් ජීවත් විය යුතු පිරිසකි.

එම අකුරේ රේඛාවල දිග ප්‍රමාණයේ වෙනස්කම් තිබිය හැකිය. දිගින් වැඩි රේඛාව ප්‍රධාන වන අතර කෙටි රේඛාව සහායක වේ යැයි අපට සිතිය හැකිය. නමුත් සැබෑ මනුෂ්‍ය සබඳතාවලදී සිදුවන්නේ, අප යමෙකුට උපකාර කරනවා යැයි සිතුවත් ඇත්ත වශයෙන්ම ඔවුන්ගෙන් අපි උපකාර ලබා සිටිනවා විය හැකියි. කෙසේහෝ එකිනෙකාට උපකාර කිරීමේ උතුම් ගුණය තුළ කිසිදු වෙනසක් නැත.

එම නිසා, 'තමන් බොහෝ දෙනෙකුගේ උපකාරයෙන් ජීවත් වන නිසා, තමා විසින් ද අනෙක් අයට උපකාර කරමින් ජීවත් විය යුතුයි' යන්න ඉතා සාමාන්‍ය සිතුවිල්ලකි. උදාහරණයක් ලෙස, අප යමෙකුට උපකාර කළ විට අපේ සිතට දැනෙන සතුට වචනයෙන් විස්තර කළ නොහැක. එවැනි අත්දැකීම් අප සැමට තිබෙනවා.

එබැවින්, සුහදශීලී මනුෂ්‍ය සබඳතා වර්ධනය කර ගැනීමට ඉඟියක් ලෙස, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සඳහන් ධර්මාචාර්යවරයෙක් යන 10 වන පරිච්ඡේදයේ සඳහන් 'තථාගතයන් වහන්සේගේ සිවුර දරා ගැනීම' යන පාඨය පිළිබඳව සිතා බලමු.

'තථාගතයන් වහන්සේගේ චීවරය' යනු, 'මෘදු බවින් හා ක්ෂාන්තියෙන් පිරිපුන් හදවතයි' ලෙසින් විස්තර කර තිබෙනවා. 'මෘදු මොළොක් බව' යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඉතා සැහැල්ලු හා සාමකාමී සිතයි. එය අන් අය සමඟ ගැටෙන, විවේචනය කරන හෝ රිදවන රළු සිතක් නොව, අවට සිටින සියල්ලන්ම වැළඳ ගන්නා සහ අන් අය සමඟ සමගියෙන් කටයුතු කරන උතුම් හැඟිමකි.

ඉදිරියේදී 'මගේම ශක්තියෙන් මම තනිව ජීවත් වෙනවා' යන සිතුවිල්ලට වඩා, 'සියලු මිනිසුන්ගේ සහ සියලු දේවල උපකාරයෙන් මාව ජීවත් කරවනවා' යන සිතුවිල්ල ඉතා වැදගත් වේ. මෙම 'ජීවත් කරවනු ලබනවා' යන හැඟීම, 'තථාගතයන් වහන්සේගේ සිවුර දරා ගැනීම' යන වචනයෙන් සංකේතවත් වන බව විශ්වාස කරමි.

බුදුරජාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන් පෙරවූ සිවුරු සකස් කරගත්තේ, සොහොන් බිම්වලට දමන ලද රෙදි කැබලි හෝ කුණු කූඩවල තිබූ රෙදි කැබලි එකතු කර, ඒවා පිරිසිදු කර මසා ගැනීමෙනි. ඒවා රතු පස්වලින් වර්ණ ගන්වා කහ හෝ තැඹිලි පැහැයෙන් යුක්ත විය. එය 'ලෝකයා විසින් තමාව ජීවත් කරවනවා' සහ 'සෑම දෙයකින්ම තමන්ට උපකාර ලැබෙනවා' යන නිහතමානී හැඟීම ප්‍රායෝගිකව පෙන්වීමක් විය.

අපව ජීවත් කරවන්නේ කුමක්දැයි අප ගැඹුරින් සිතා බැලුවහොත්, අවසානයේදී 'සෑම දෙයකින්ම සහ සෑම කෙනෙකුගෙන්ම අප ජීවත් කරවනු ලබනවා' යන සත්‍යය අපට තේරුම් ගැනීමට සිදු වේ. තවද, 'එම ජීවත් කරවීම නිහතමානීව පිළිගැනීම සතුටට පත්වන හොඳම මාර්ගයයි' යන සත්‍යය එවිට වැටහෙනු ඇත.

'තමාව ජීවත් කරවනු ලබනවා' යැයි සිතන විට, අන් අය සමඟ ගැටීමට, තරඟ කිරීමට හෝ විවේචනය කිරීමට කිසිදු සිතුවිල්ලක් ඇති නොවේ. සිත තුළ ඇති වන්නේ 'කෘතඥතාව' පමණි. එවිට සිත නිරායාසයෙන්ම නම්‍යශීලි වේ. එවැනි සිතක් ස්වාභාවිකවම මුහුණේ ඉරියව්වලින්, වචනවලින් සහ ක්‍රියාවලින් ප්‍රකාශ වන අතර, එය දකින අයට ප්‍රසන්න හැඟීමක් ලබා දෙයි. එයින් යහපත් වූ මනුෂ්‍ය සබඳතා බිහිවේ.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 95-97 පිටුව ඇසුරිණි

# නිහඬව පිපෙන වයලට් මලක් මෙන්

මඑද තකෙෂි මහතා
රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ අන්තර්ජාතික ප්‍රධානී

සැමට සුබ දවසක් වේවා. මේ මාසය සිදුහත් කුමරු උපත ලැබූ උතුම් මාසය බවටයි ජපානයේ පිලිගැනෙන්නේ. ඉංග්‍රීසි බසින් අප්‍රේල් යන වචනය බිහිවී ඇත්තේ 'විවෘත කිරීම' යන අර්ථය ඇති ලතින් වචනයෙන් බව පැවසේ. වසන්තය යනු මල් පිපී ජීවය දලුලන කාලයයි. මෙවන් කාලයක බුදුරජාණන් වහන්සේ මෙලොවට බිහිවීම තුළ ගැඹුරු අර්ථයක් ඇති බව මට හැගෙයි.

නිච්කෝ සෙන්සෙයිගේ ධර්ම පණිවුඩය තුල සඳහන් වයලට් මල, කැපී පෙනෙන මලක් නොවූවත්, එය ශක්තිමත්ව ජීවත් වෙමින් මිනිස් සිත් සනසන නිහතමානී පැවැත්මක් ලෙස හඳුන්වා දී ඇත. වර්තමාන ලෝකය සැමවිටම ප්‍රතිඵල සහ ඇගයීම් බලාපොරොත්තු වන, අන් අයට වඩා ඉදිරියට යාමට හදිසි වන කාලයකි. නමුත් වයලට් මල අන් අය සමඟ තමා සැසඳීමක් නොකරයි. සුදුසු කාලය පැමිණි විට නිහඬව මල් පල දරයි. සුළඟට හසුවූවත්, එය පසෙහි ශක්තිමත්ව මුල් ඇදගෙන, කුඩා වූත් ස්ථිර වූත් ශක්තිය විදහා දක්වමින් අපට නිහඬ ධෛර්යයක් ලබා දෙයි. අපේ එදිනෙදා ජීවිතය තුළ ද අන් අය වෙනුවෙන් නිහඬව කැපවන මිනිසුන් තුළ ඇත්තේ ද එවැනිම උතුම් බවක් නොවේද?

සිදුහත් කුමරුගේ උදාන වාක්‍ය වන 'මම ලොවට අග්‍ර වෙමි, මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි' යන්නෙන් අදහස් වන්නේ, තමා පමණක් ශ්‍රේෂ්ඨ බව නොවේ. සෑම පුද්ගලයෙකුගේම ජීවිතය අන් කිසිවකට සමාන කළ නොහැකි තරම් වටිනා බවයි. එබැවින් අප අන් අය සමඟ සැසඳීමෙන් තොරව, තම තමාට හිමි ස්ථානයේ උපරිම ශක්තිය යෙදවීම ප්‍රමාණවත්ය.


කුඩා සතුටක් හෝ හමුවීමක් වුවද අගය කරමින් ජීවත් වීම අපගේ සිත සුවපත් කරයි. නිච්කෝ සෙන්සෙයි දේශනා කළ පරිදි, මේ මාසයේ අපද වයලට් මලක් මෙන් නිහතමානීව, මානයෙන් තොරව සහ අන් අය සමඟ ගැටුම් ඇති කර නොගෙන ජීවත් වීමට උත්සාහ කරමු. එවැනි යහපත් ක්‍රියාවල එකතුව අප තුළ ඇති බුද්ධ ස්වභාවය නිහඬව බැබළීමටත්, අවසානයේ මුළු ලෝකයම ආදරයෙන් ආලෝකවත් කිරීමටත් හේතු වනු ඇත.



දයිසෙයිදෝවේ සෙප්පෝව සඳහා ශ්‍රී ලංකාවෙන් පැමිණි ස්වර්ණා දෙල්ගොඩ මහත්මියව (මැද) අන්තර්ජාතික මූලස්ථානයට පිළිගනිමින් (ඉදිරිපෙළ වම් කෙලවර මඑද මහතා) මාර්තු මස 12 වන දින




# A Global Buddhist Movement




## Information about local Dharma centers

facebook

X

We welcome comments on our newsletter Living the Lotus: [living.the.lotus.rk-international@kosei-kai.or.jp](mailto:living.the.lotus.rk-international@kosei-kai.or.jp)